පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-ව්‍යාපාර අධ්‍යයනය

සතිය - 3

ශ්‍රේණිය-12

සකස් කළේ - රේණුකා අලුත්වත්ත මිය,ර/විද්‍යාරාජ විද්‍යාලය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

නිපුණතාව 7.0 -

නිපුණතා මට්ටම 7.5 - වානිජ බැංකු සපයන සේවා ව්‍යාපාරයක ක්‍රියාකාරීත්වයට ඇති කරන බලපෑම පෙන්වා දෙයි.

**<u>මාතෘකාව - වානිජ බැංකු සපයන සේවා</u>**

තැන්පතු භාර ගැනීම හා ණය සැපයීමට අමතරව වානිජ බැංකු විසින් ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට බලපාන පහත සඳහන් සේවාද සපයනු ලබයි.

1.නියෝජිත සේවා - ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම.
උදා - සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම
විදුලි බිල්පත්,ජල බිල්පත් ගෙවීම

2.කල් බදු සේවා - ව්‍යාපාරිකයන්ට අවශ්‍ය වත්කම් බද්දට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම.
උදා - පීපල්ස් ලීසිං සමාගම

3.විද්‍යුත් බැංකු සේවා - අන්තර්ජාලය ඔස්සේ බැංකු කටයුතු කිරීමට පහසුකම් සැපයීම.
උදා - හෝම් බැන්කිං,දුරකථන බැංකු සේවා

4.උකස් සේවා - හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා වත්කම් උකසට ගෙන ණය සැපයීම.

5.සුරක්ෂිතාගාර පහසුකම් - පුද්ගලයන්ගේ වටිනා භාණ්ඩ හා ලියවිලි ආරක්ෂා කර දීමට සේප්පු පහසුකම් සැපයීම.

6.විදේශ විනිමය මිළදී ගැනීම හා විකිණීම

7.ණයපත් සේවාව - නිශ්චිත වටිනාකමක් දක්වා භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි කාඩ්පත් නිකුත් කිරීම.උදා - වීසා කාඩ්පත්,මාස්ටර් කාඩ්පත්

8.මුදල් ප්‍රේෂණ කටයුතු - ගිණුම් හිමියාට විවිධ පාර්ශවයන්ගෙන් ලැබීමට ඇති මුදල් රැස් කිරීම.

9.සංචාරක චෙක්පත් නිකුත් කිරීම - සංචාරක කටයුතුවල යෙදෙන්නන්ගේ ගනුදෙනු පහසුව සඳහා චෙක්පත් නිකුත් කිරීම.

10.ස්වයංක්‍රීය බැංකු සේවා - පරිගණකගත කරන ලද යන්ත්‍රයකින් ගනුදෙනුකරුවන්ට බැංකු කටයුතු කර ගැනීමට පහසුකම් සැපයීම.

11.ණයවර ලිපි නිකුත් කිරීම - විදේශ වෙළෙඳාමේදී භාවිතා වන ගෙවීම් උපකරණයකි.

12.වෙනත් සේවා - රක්ෂණ සේවා (ගිණුම්හිමියන් රක්ෂණය කිරීම)
වෛද්‍ය සේවා ( Echannelling)

පැවරුම්පත

1.වානිජ බැංකු සපයන සේවා ලැයිස්තු ගත කරන්න.
2.එම එක් එක් සේවා ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාර දෙක බැගින් ලියන්න.
3.ස්වයංක්‍රීය බැංකු සේවා නිසා ගනුදෙනුකරුවන්ට අත්වන වාසි හා බැංකුවලට අත්වන වාසි වෙන වෙනම ලියන්න.
4.ඔබ ප්‍රදේශයේ ඕනෑම ව්‍යාපාරයක් වානිජ බැංකුවලින් ලබා ගෙන ඇති සේවා විමසා ලැයිස්තුවක් සකස් කරන්න.